**මානව සම්පත් අභිවර්ධන ආයතනය**

**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශ්‍රම අධ්‍යාපනවේදී ඩිප්ලෝමා පාඨමාලාව - 2022/23**

**(පළමු සෙමෙස්තරය)**

**(පවත්වන ලද්දේ 2022 නොවැම්බර්)**

# DY 03 - ආර්ථික විද්‍යාව

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු ලියන්න.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සහ පිටු එකකින් (01) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණය වී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. (I) "ආර්ථික විද්‍යාව සමාජ විද්‍යාවකි."
ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(II) ආර්ථික භාණ්ඩ හා ආර්ථික නොවන භාණ්ඩ අතර වෙනස්කම් උදාහරණ දක්වමින් පැහැදිලි කර, ආර්ථික නොවන භාණ්ඩද ආර්ථික භාණ්ඩ වන අවස්ථා දක්වන්න.

(ලකුණු 15)
(මුළු ලකුණු 25)

02. (I) මූලික ආර්ථික ප්‍රශ්න මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(II) ධනවාදී ආර්ථිකයක මූලික ආර්ථික ප්‍රශ්න විසඳාගන්නා ආකාරය, සමාජවාදී ආර්ථිකයක මූලික ආර්ථික ප්‍රශ්න විසඳගන්නා ආකාරයෙන් වෙනස්වන අයුරු පැහැදිලි කරන්න.

(ලකුණු 15)
(මුළු ලකුණු 25)

03. (I) ආවස්ථික පිරිවැය සංකල්පය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(II) වැඩෙන ආවස්ථික පිරිවැය යටතේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් ඔබගේ කල්පිත සංඛ්‍යා යොදාගනිමින් නිර්මාණය කර, එහි ආවස්ථික පිරිවැය වැඩෙන බව ඔප්පු කර පෙන්වන්න.

(ලකුණු 20)
(මුළු ලකුණු 25)

04. (I) ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින උද්ධමනකාරී තත්ත්වය ආර්ථිකයේ විවිධ පාර්ශවයන් හට බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(II) මෑත කාලීන රුපියල අවප්‍රමාණය වීම ශ්‍රී ලංකා ආර්ථිකයට සිදු කල බලපෑම විස්තර කරන්න.

(ලකුණු 15)
(මුළු ලකුණු 25)

05. පහත සඳහන් සංකල්ප පිළිබඳව කෙටි සටහන් ලියන්න.
(I) නිෂ්පාදන සාධකයක් ලෙස භූමිය
(II) නිෂ්පාදන සාධකයක් ලෙස ශ්‍රමය
(III) නිෂ්පාදන සාධකයක් ලෙස ප්‍රාග්ධනය
(IV) නිෂ්පාදන සාධකයක් ලෙස ව්‍යවසායකත්වය
(V) ආර්ථික විද්‍යාවේ "හිඟකම" නැමැති සංකල්පය

(මුළු ලකුණු 5x5 = 25)